වගා ආධාර චක්‍රලේඛ අංක: 17

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,

අංක 349, ගාලු පාර,

කොළඹ 03.

1989.02.22 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

මාතෘකාව: අලුතින් තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය යටතේ අත්තිකාරම් ගෙවීම

1.0 පසුබිම: 1989.01.18 දිනැති වගා ආධාර චක්‍රලේඛ අංක 10 මගින් උපදෙස් දී ඇති තේ නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ අත්තිකාරම් ගෙවීමට කටයුතු කරන ලද ආකාරයටම අලුත් වගා සහනාධාර මුදලින් අත්තිකාරම් ගෙවීමට ඉඩකඩ සැලසීම මෙහි අරමුණයි.

2.0 ක්‍රියා මාර්ගය: අලුතින් තේ වගා කිරීමේ සහනාධාර මුදලින් අත්තිකාරම් ගෙවීම පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක කරන්න.

2.1 මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනුයේ දැනටමත් අනුගමනය කරන අලුත් වගා සහනාධාර ගෙවීමේ සාමාන්‍ය ක්‍රමයට අතිරේක වශයෙනි. එසේ වුවද සහනාධාර අත්තිකාරම් ගෙවීම කළ යුත්තේ ඉඩමේ මුළු බිම් ප්‍රමාණය නොසලකා හෙක්ටාර් 02 ක් හෝ ඊට වඩා අඩු බිම් ප්‍රමාණයක් වෙනුවෙන් නිකුත් කර ඇති අලුත් වගා අවසර පත්‍ර සඳහා පමණකි.

2.2 සහනාධාර අත්තිකාරම් සඳහා අංක 1 උප ලේඛණයේ පරිදි ඉල්ලීමක් කළ යුතු අතර, ඒ සඳහා අංක 2 උප ලේඛණයේ සඳහන් ආකාරයට අත්තිකාරම් ගෙවීමට පුළුවන. එකී අංක 1 සහ අංක 2 උප ලේඛණ ඉල්ලුම් පත්‍ර කට්ටලයට අමුණා නිකුත් කළ යුතුය.

2.3 සහනාධාර අත්තිකාරම් ගෙවීම, අංක 3 උප ලේඛණය පරිදි, අදාල අවසර පත්‍රය යටතේ අනුමත කළ හැකිය. එකම ඉඩමක වුවද හෙක්ටාර් 02 ක් හෝ ඊට වඩා අඩු බිම් ප්‍රමාණයක් වෙනුවෙන් නිකුත් කරන අවසර පත්‍ර කීපයක් යටතේ අත්තිකාරම් ගෙවීම අනුමත කළ හැකිය. එහෙත් පළමු අවසර පත්‍රය යටතේ අත්තිකාරම් ලබා පස සංරක්ෂණ කටයුතු අවසන් කර ඇති විට පමණක් දෙවැනි අවසර පත්‍රය යටතේ ප්‍රථම අත්තිකාරම් වාරිකය ගෙවීමට පුළුවන. (එහෙත් දෙවැනි අවසර පත්‍රය යටතේ එකී අවස්ථාව දක්වා වගා කටයුතු කර නොමැති නම් එතෙක් සාර්ථකව කරන ලද වැඩ කොටස් වෙනුවෙන් අත්තිකාරම් ගෙවීමකින් තොරව සාමාන්‍ය ක්‍රමය යටතේ සහනාධාර ගෙවීම කළ හැකිය.)

2.4 අලුත් වගා ආධාර ක්‍රමය යටතේ භාවිත කරනු ලබන පහත දැක්වෙන ආකෘති පත්‍ර හැරුණු විට දැනට භාවිත කරන අනෙකුත් සියලුම ආකෘති පත්‍ර අත්තිකාරම් ක්‍රමය සඳහාද භාවිත කළ හැකිය. සංශෝධිත ආකෘති පත්‍ර පමණක් අදාල සංශෝධනයන්ද සහිතව පහත දැක්වේ.

| ආකෘති පත්‍ර අංකය සහ නම | සංශෝධනය |
|---|---|
| 1. එන්.පී.7 ඒ,බී. අවසර පත්‍ර ආවරණ ලිපිය සහ ප්‍රකාශණය | අංක 3 උප ලේඛණයේ දැක්වෙන පරිදි |
| 2. එන්.පී. 11 වවුචරය | 'අත්තිකාරම් ගෙවීම' යන්න ආකෘති පත්‍රයේ ඉහලින් සඳහන් කිරීම |
| 3. එන්.පී.13 දර්ශක පත්‍රය | දර්ශක පත්‍රයේ අදාල ගෙවීම සටහන් කොට එය ඉදිරියෙන් "*" ලකුණ යොදා එම තීරුවට ඉහලින් "අත්ති" හෝ "Adv " යනුවෙන් සඳහන් කරන්න. |

2.5 දැනටමත් ඉහත උපරිම සීමාව නොඉක්මවන අවසර පත්‍රයක් හිමි තැනැත්තෙකු විසින් යම් ආධාර මුදලක් ලබාගෙන තිබුණද, එකී අවසර පත්‍රය යටතේ කළ යුතු ඉදිරි වැඩ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ඉල්ලා ඇත්නම්, එම අවස්ථාවේ සිට ඉදිරියට ගෙවීමට ඇති මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවීමට පුළුවන. එකී ඉල්ලීම් සම්බන්ධයෙන් මෙහි අංක 3 ඒ. උප ලේඛණය පරිදි අනුමත කිරීමට පුළුවන.

2.6 අත්තිකාරම් ගෙවීමේ ක්‍රමයට අදාලවද දැනට අලුත් වගා සාමාන්‍ය ආධාර ක්‍රමය පිළිබඳව වාර්තා තබාගන්නා ආකාරයටම වෙනම වාර්තා තබාගත යුතු අතර, එම වාර්තා මාසිකව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

(වී. කේ. නානායක්කාර)
සභාපති.

පිටපත්:- 1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
3. සහකාර සාමාන්‍යාධිකාරී(මුදල්)
4. අභ්‍යන්තර විගණක
5. ක්‍රම සම්පාදන නිලධාරී
6. සංඛ්‍යාලේඛණ නිලධාරී
7. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
8. සියලුම [illegible]